# ගෝලීය රටවල විත්ති

# දියමන්තියෙන් බැබළෙන බොට්ස්වානා ආර්ථිකය



**ආර්ථික වශයෙන් දිළිඳු රාජ්‍යයන් ඒවා සතු විභවයන් පාවිච්චි කර දියුණුව කරා ගමන් ගන්නා ආකාරය මෙවර පැහැදිලි කරන්නේ අප්‍රිකානු කලාපයේ බැබළෙන ආර්ථිකයකට හිමිකම් කියන බොට්ස්වානා රාජ්‍යය ඇසුරිනි. දියමන්ති ඇතුළු ස්වාභාවික සම්පත් රටේ ආර්ථිකයට සහ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන අයුරින් කළමනාකරණය කරමින් ආර්ථික වශයෙන් ජවසම්පන්න මාර්ගයක ගමන් කරමින් සිටින බොට්ස්වානාවෙන් ශ්‍රී ලංකාවට උගත හැකි පාඩම් ගැනත් මේ ලිපියෙන් අවධානය යොමු කෙරේ. මෙවරත් අදහස් දැක්වීම සඳහා ඉදිරිපත් වෙන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ මහතාය.**

## 1966 නිදහස ලබන විට අප්‍රිකාවේ දුප්පත් රටක්

බොට්ස්වානා රාජ්‍යය මුළුමනින්ම යටත්විජිතකරණයකට ලක්වූයේ නැත. එය බ්‍රිතාන්‍යයන් යටතේ ආරක්ෂිත රාජ්‍යයක් වශයෙන් පැවතිණි. බොට්ස්වානා, බ්‍රිතාන්‍යයේ අර්ධ යටත් විජිතයක් විය. එරටින් එවකදී ලබා ගත හැකි සම්පත් නොතිබූ නිසා යුරෝපීයයෝ වැඩි අවධානයක් යොමු නොකළාහ. එහෙත් දකුණු අප්‍රිකාව, සිම්බාබ්වේ වැනි රටවල් බ්‍රිතාන්‍යයේ යටත් විජිත වශයෙන් ක්‍රියාත්මක විණි. බොට්ස්වානාව අර්ධ යටත්විජිත තත්ත්වයෙන් නිදහස ලැබූවේ 1966දී ය. එම අවධියේ දී එරටේ ආර්ථික ක්‍රියාකාරකම් අතර සත්ත්ව පාලනය මූලික විය. එයින් ද හරක් මස් නිෂ්පාදනය ඉහළ අගයක පැවතිණි. එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 40ක් විය. බොට්ස්වානාව නිදහස ලබන විට අප්‍රිකානු කලාපයේ දුප්පත් රටවල් අතර එකක් විය. ආර්ථිකය දියුණුකර ගැනීමට අදාළව කිසිදු විභවතාවක් ද එවකදී නොතිබිණි.


යටිතල පහසුකම් හොඳ තත්ත්වයක නොපැවති අතර විධිමත් ලෙස සැකසූ මාර්ගවල උපරිම දිග කිලෝමීටර් 12කට වැඩි නොවීය. අධ්‍යාපනය අතින් ද එරට එවකදී යහපත් තත්ත්වයක නොසිටි අතර උපාධි ලැබූ පිරිස විස්සකටත් අඩු විය. මෙපරිදි ආර්ථික, යටිතල පහසුකම් සහ අධ්‍යාපන අංශවලින් නොදියුණු තත්ත්වයක පසු වූ බොට්ස්වානාව වෙනස් වෙන්නේ දියමන්ති හමු වූ පසුය. ඩී-බියර්ස් (DE-BEERS) නමින් හැඳින් වූ එංගලන්ත - දකුණු අප්‍රිකානු ඒකාබද්ධ සමාගමක් විසින් සිදු කරන ලද කැණීම් මගින් එරටින් පළමු වතාවට දියමන්ති සොයාගැනිණි. ඒත් සමග බොට්ස්වානා ආර්ථිකය විශාල පිබිදීමකට ලක් විය. දියමන්ති මත පදනම් වූ ආර්ථිකයක් ගොඩනැගිණි.

එරටේ ජනගහනය මිලියන 2.6ක් පමණ වේ. 2022 වෙන විට ඒකපුද්ගල ආදායම ඩොලර් 7700 ක් පමණ විය. එහි ප්‍රතිශතාත්මක අගය දැක්වුණේ සියයට 5.8 ක් වශයෙනි. උපසහරා අප්‍රිකානු රාජ්‍යයන් අතර ආර්ථික වශයෙන් ඉහළ ශක්තියක් ඇති රට වෙන්නේ බොට්ස්වානාවයි. දියමන්ති යනු එරට ආර්ථිකයේ මූලික සංචරකයක් වුවත් එය එකම සාධකය නොවේ. සැම්බියාව, නයිජීරියාව, කොංගෝ, සියරාලියෝන් වැනි තවත් අප්‍රිකානු රටවල් රැසකින්ම දියමන්ති ඇතුළු ස්වාභාවික සම්පත් සොයා ගැනුණි. ඒවා අතරින් සියරාලියොන් යනු දියමන්ති සහිත ප්‍රධාන රාජ්‍යයයි. නයිජීරියාවෙන් ඛනිජ තෙල් සොයා ගැනිණි. ස්වාභාවික සම්පත් සහිත සෙසු අප්‍රිකානු රටවල් අතර බොට්ස්වානා ඉහළ දියුණුවක් සහිත රටක තත්ත්වයට පත් වූයේ කෙසේද යන්න විමසා බැලීම වැදගත්ය.

බොට්ස්වානා හැර ඉහත සඳහන් කළ අනිත් අප්‍රිකානු රාජ්‍යයන්වලින් වටිනා ස්වාභාවික සම්පත් සොයා ගැනුණ ද එම රටවල් බොට්ස්වානාව මෙන් දියුණු තත්ත්වයට පත් වූයේ නැත. දියුණුව වෙනුවට එම රටවල්වල උද්ගත වූයේ විවිධ ගැටුම්, දූෂණ, පවුල් කිහිපයක් පමණක් ස්වාභාවික සම්පත් සූරා කෑම් ආදී තත්ත්වයන්ය. ස්වාභාවික සම්පත් උපයෝගී කරගෙන රටේ ආර්ථිකය දියුණු කර ගැනීමට බොට්ස්වානාවට හැකි වූයේ කරුණු දෙකක් නිසාය. එනම්, යහපාලනය හා නිවැරදි ප්‍රතිපත්තීන් ය.

## රටින් සොයාගත් දියමන්ති සුළු පවුල් කිහිපයකට ගසා කෑමට ඉඩ දුන්නෙ නෑ

යහපාලනය යටතේ ආරම්භයේ පටන්ම පෞද්ගලික දේපළවල හිමිකාරීත්වය නියමාකාරයෙන් සුරක්ෂිත කෙරිණි. එම දේපළ වෙනත් පාර්ශ්වවලට පවරා ගැනීමක් සිදු නොවුණි. එහෙත් ඇතැම් රටවල් නිදහස ලැබූ පසු යටත්විජිතවාදීන්ට හෝ වෙනත් පාර්ශ්වවලට හිමිව ඇති දේපොළ රජයට පවරා ගැනීම් ආදිය සුලභව සිදු විය. යහපාලනය යටතේ නීතියේ ආධිපත්‍යය ද බොට්ස්වානාහි තහවුරු කෙරිණි. යටත්විජිතවාදීන්ගෙන් නිදහස



බොට්ස්වානාහි පළමු ජනාධිපති සෙරෙට්සේ කාමා



ලැබූ බොහෝ අප්‍රිකානු රටවල ඒකාධිපති පාලන ව්‍යුහ ගොඩනැගුණි. එහෙත් බොට්ස්වානාහි නිදහස ලැබූ දා සිට මේ දක්වා බහු පක්ෂ ක්‍රමය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් දක්නට ලැබේ. ඊට පදනම දැමූවේ එරටේ පළමු ජනාධිපතිවරයා වූ සෙරෙට්සේ කාමායි. ඔහු හොඳින් ඉගෙනගත් පාලකයකු වූ අතර නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී ආයතනික ව්‍යුහය ගොඩනැගීම, රටට සහ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි දියමන්ති සොයාගත් ආයතනය සමග කටයුතු කිරීම සිදුවූයේ ඔහුගේ පාලන කාලයේය. මෙසේ ස්ථාපිත කරන ලද ආර්ථික, දේශපාලනික, ආයතනික ව්‍යුහය හේතුවෙන් එරටින් සොයාගන්නා ලද ස්වාභාවික සම්පත් සුළු පිරිසකට ගසා කෑමට ඇති හැකියාව නැති කර එය රටේත් ජනතාවගේත් ආර්ථික සුබසිද්ධිය පිණිස යෙදවීමට හැකි විය.

මීළඟට ප්‍රතිපත්ති පැත්තෙන් ඇති කරන ලද වෙනස්කම් සලකා බැලිය හැකිය. ඒ යටතේ වෙළෙඳාම ලිහිල් කොට සෙසු රටවල් සමග වෙළෙඳ ගනුදෙනු වැඩි කර ගත්තේය. දියමන්තිවලින් ඉපැයූ ආදයම් අධ්‍යාපන, සෞඛ්‍ය සහ යටිතල පහසුකම් ක්ෂේත්‍ර දියුණු කිරීමට මූලික වශයෙන් යොදවන ලදී. වඩාත්ම වැදගත් දෙය නම්, දියමන්තිවලින් රජයට ලැබෙන ආදයම් ඉතිරි කිරීමය. රාජ්‍ය මූල්‍ය ඉතිරි කිරීම් අරමුදල නමින් අරමුදලක් ඇති කර, ආර්ථික වශයෙන් අපහසු අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා එහි මුදල් ඉතිරි කළේය. දියමන්ති සුලභ රටක් වෙන සියරා ලියෝන්හි එවැනි තත්ත්වයක් ඇති වූයේ නැත. සෙසු රටවල් මෙන් උපයන ආදයම් සියල්ල වියදම් කරන ප්‍රවේශයකට බොට්ස්වානා ගමන් කළේ නැත. උපයන ආදයම්වලින් යම් ප්‍රමාණයක් ඉතිරි කරන මෙවැනි ක්‍රමවේදයක් ගැන ශ්‍රී ලංකාව කිසිද කල්පනා කළේ නැත.

## දියමන්ති අලෙවියෙන් උපයන ලද ආදායම් රටේ අධ්‍යාපන, සෞඛ්‍ය, යටිතල පහසුකම් අංශ දියුණු කිරීමට යෙදෙව්වා

දියමන්තිවලින් ලැබෙන ආදයම්වලින් සංචිත ඉහළ නංවාගැනීමටත් බොට්ස්වානාව කටයුතු කළේය. එයින් නොනැවතී, සිය මුදල් දිගුකාලීන ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ අරමුණින් විදේශ රටවල ආයෝජනය කළේය. චීනය ඔවුන්ගේ අතිවිශාල වෙළෙඳ අතිරික්තය අනෙක් රටවල ආයෝජනය කරන්නේ යම් සේද බොට්ස්වානාවත් එවැනි පියවර අනුගමනය කළේය. මේ සියලු ක්‍රියාමාර්ග ඔස්සේ ආර්ථිකයේ ඵලදායීතාව ඉහළ නංවාගැනීමට එරටට හැකි විය.



කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ

අපනයන ආදයම් ගත්ත ද රජයේ ආදයම් හා ආර්ථික ක්‍රියාකාරකම් ගත්තද දියමන්ති මත රැඳියාව සියයට 80 ඉක්මවයි. ඉදිරිපත්ව ඇති පුරෝකථනවලට අනුව, 2030 පමණ වෙන විට බොට්ස්වානාවේ දියමන්ති සම්පත අවසන් වෙනු ඇත. ඒ බව දැනගෙන ඒ සඳහා සූදානම් වීමට ද එරට කටයුතු කර තිබේ. ඒ යටතේ ආර්ථිකය විවිධාංගීකරණය වෙනුවෙන් යම් යම් පියවර ගෙන තිබේ. ඒ අනුව, කිව හැක්කේ බොට්ස්වානාවේ දියුණුව හුදෙක් දියමන්ති ලැබීම නිසා සිදු වූවක් නොවන බවත් එම ස්වාභාවික සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා නිවැරදි පියවර අනුගමනය කිරීම බවත්ය.

ආර්ථික නිදහස පිළිබඳ දර්ශකය යටතේ ව්‍යාපාර කිරීම, පෞද්ගලික දේපළවල සුරක්ෂිතතාව, රජයේ ස්ථාවරභාවය, නීතියේ ආධිපත්‍යය ආදී සෑම අංශයකම ඉහළ කාර්යසාධනයක් අත්කර ගැනීමට එරටට හැකි වී තිබේ. මේ දර්ශකයේ 52 වැනි තැන බොට්ස්වානාව හිමි කර ගෙන ඇත. එහි ශ්‍රී ලංකාව පසුවෙන්නේ 137 තැනය.

මේ බොට්ස්වානා ආදර්ශයෙන් ශ්‍රී ලංකාවට උගත හැකි දේවල් ගැන මීළඟට අවධානය යොමු කළ හැකිය. එරටට සාපේක්ෂව ලංකාවට බ්‍රිතාන්‍යයන්ගෙන් බොහෝ දේවල් හිමි විය. මනා පරිපාලන හා අධිකරණ යාන්ත්‍රණයක් ද හොඳ අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවක් ද මහා මාර්ග පද්ධතියක් ද ඒ යටතේ අපට හිමි විය. නිදහස ලබන අවධියේදී

**ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයන්: ශ්‍රී ලංකාව සහ බොට්ස්වානාව**

| | ශ්‍රී ලංකාව | බොට්ස්වානාව |
|---|---|---|
| ආර්ථිකය නිදහසට අනුව වර්ගීකරණයේ ස්ථානය | 137 | 51 |
| **දර්ශකයන්** | | |
| නීතියේ ආධිපත්‍යය | | |
| දේපළ අයිතිය | 51.6 | 72.8 |
| අධිකරණ කාර්යසාධනය | 49.7 | 68.2 |
| ආණ්ඩුවේ අවංකභාවය | 39.5 | 58.6 |
| **නියාමනයන්හි කාර්යක්ෂමතාව** | | |
| ව්‍යාපාර නිදහස | 54.4 | 65.2 |
| කම්කරු නිදහස | 55.8 | 62.3 |
| මුදල් ප්‍රතිපත්තියේ නිදහස | 70.2 | 70.6 |
| **රාජ්‍ය අංශයේ ප්‍රමාණය** | | |
| බදු බර | 90.3 | 87.3 |
| රාජ්‍ය අංශයේ වියදම් | 88.0 | 61.1 |
| රාජ්‍ය මූල්‍ය යහපැවත්ම | 0.0 | 19.2 |
| **විවෘතභාවය** | | |
| විදේශ වෙළෙඳ නිදහස | 67.2 | 78.6 |
| විදේශ ආයෝජන නිදහස | 30.0 | 65.0 |
| මූල්‍ය නිදහස | 30.0 | 70.0 |
| **ආර්ථිකය** | | |
| ඒක පුද්ගල ආදායම | 3,347 | 7,735 |

දර්ශකයන්හි අගය 100 ආසන්නව පැවතීම යහපත් තත්ත්වයක් පෙන්නුම් කරේ.

දත්ත මූලාශය:
The Heritage Foundation and World Bank

බොට්ස්වානාවේ ආයු අපේක්ෂාව අවුරුදු 37 කි. ඊට සාපේක්ෂව ලංකාවේ ආයු අපේක්ෂාව ඉතා හොඳ මට්ටමක පැවතිණි. එමෙන්ම අපට වඩාත් හොඳ යටිතල පහසුකම් ද තිබිණි. ඒවා ශ්‍රී ලංකාවට ඉතා වැදගත් වූයේ අලුතින් ස්ථාපිත කිරීමට අවශ්‍ය නොවූ හෙයිනි. මේ පහසුකම් සියල්ල සමග ශ්‍රී ලංකාව යහපාලනයක් ගෙන ගියේ නම් සහ නිවැරදි ප්‍රතිපත්ති අනුගමනය කළේ නම් විශේෂයෙන්ම අපනයන ප්‍රමුඛ කරගත් ආර්ථික ගමනකට ප්‍රවේශ වූයේ නම් ශ්‍රී ලංකාවටත් බොට්ස්වානාව මෙන් ආර්ථික දියුණුවක් උදා කර ගැනීමට හැකියාව තිබිණි.

## ජනාධිපතිවරු දේශපාලන වාසි වෙනුවෙන් වර්ගවාදය ජාතිවාදය යොදාගත්තෙ නෑ

බොට්ස්වානාවේ බලයට පත් බොහෝ ජනාධිපතිවරු ඉහළ අධ්‍යාපනයක් ලැබූවෝ වූහ. ඔවුන්ගෙන් සමහරු ඇමෙරිකාවේ හෝ බ්‍රිතාන්‍යයේ හෝ ඉගෙනුම ලැබූහ. එබැවින් ඔවුහු රාජ්‍ය පාලනයේ දී ජාතිය, ආගම වැනි පටු සංකල්ප මත පදනම්ව පාලනය ගෙන යෑම වෙනුවට විවෘත මානසිකත්වයකින් යුතුව පාලනය ගෙන ගියහ. දේශපාලන වාසි වෙනුවෙන් වර්ගවාදය, ජාතිවාදය භාවිත නොකළහ. එරටෙහි ද යම් පමණක පවුල් පාලනයක් ක්‍රියාත්මක වුව ද එය යහපාලනය මත ගොඩනැගුණක් විය. රැකියා වියුක්තිය, උද්ධමනය සහ දුප්පත්කම යම් පමණකට එරටෙහි ද ඉහළ මට්ටමක පවතී. ඒවා බොට්ස්වානා ආර්ථිකයේ දැකිය හැකි ප්‍රධාන ගැටලු කිහිපයකි. එසේ වුවද ඇතැම් අප්‍රිකා හා ලතින් ඇමෙරිකානු කලාපීය රටවල් සමග සැසඳීමේදී බොට්ස්වානාව අත් කර ගෙන ඇති ආර්ථික ප්‍රගතිය ස්වාභාවික සම්පත්වලින් ඔබ්බට ගොස් යහපාලනය හා නිවැරදි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් ළඟා කර ගත් එකක් බව කිව හැකිය. මෙයින් ලංකාවට උගත හැකි පාඩම නම් පමාවී හෝ යහපාලන මූලධර්ම අනුව පාලනය ගෙන යා යුතු බවත් නිවැරදි ප්‍රතිපත්ති ගත යුතු බවත් ය. එසේම අපේ ආර්ථිකය ලෝක ආර්ථිකය සමග ගැට ගසා ඉදිරියට ගෙන යා යුතුය.

## රටට අතිරික්ත ආදායමක් ලැබෙන කොට, අරමුදලක් පිහිටුවා ඒ මුදල් ඉතිරි කිරීමට බොස්ට්වානාව කටයුතු කළා

ශ්‍රී ලංකා ආර්ථිකය නිරන්තරයෙන් ඉදිරියට පැමිණියේ අයවැය හිඟයක් සහිතවය. එබැවින් ආර්ථිකයේ අර්බුදයක් ඇති වූ විට ඊට මුහුණ දීමට ඇති හැකියාව දුර්වල වේ. 2022 උද්ගත වූ ආර්ථික අර්බුදය ඊට හොඳ උදහරණයකි. 1950 හා 1970 දසකවල දී මෙරටට ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් ලැබුණි. එම මුදල් සමාජ සුබසාධනය පිණිස යෙදවූවා මිස දුෂ්කර අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉතිරි කිරීමක් සිදු නොවුණි. එහෙත් මා ඉහතදී සඳහන් කළ පරිදි බොට්ස්වානාව ඒ වෙනුවෙන් අරමුදලක් පිහිටුවා කටයුතු කළේය. එය අපට බොට්ස්වානාවෙන් උගත හැකි තවත් පාඩමකි.

ශ්‍රී ලංකාව ද මැණික්, පොස්පේට් වැනි වටිනා ස්වාභාවික සම්පත් සහිත රටකි. එහෙත් ප්‍රශ්නය වෙන්නේ එම සම්පත් නිසි අයුරින් භාවිත කරන්නේ ද යන්නය. ඒවායෙන් කිහිප දෙනකුට මුදල් ඉපැයීමට ඉඩ ලබා දී ඇතත් රටට හා ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි යොදගැනීමට කටයුතු කර නැත.

බොට්ස්වානාව ඉහළ රාජ්‍ය මූල්‍ය විනයක් පවත්වා ගෙන යයි. රජයට මුදල් තිබුණ ද ඒවා යොදවමින් රාජ්‍ය ව්‍යාපාර ඇති කළේ නැත. මේ හේතුවෙන් එරටේ රාජ්‍ය ව්‍යවසායයන් මගින් ජාතික නිෂ්පාදනයට දක්වන දායකත්වය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 කටත් වඩා අඩු ප්‍රමාණයකි. ඒ සඳහා පෞද්ගලික අංශයට ඉඩ ප්‍රස්ථා ලබා දුන්නේය. එය ඉතා වැදගත්ය. මන්ද, ආර්ථිකයේ සියලු කටයුතු රජය විසින් දරනු ලැබිය යුතු නැති නිසාය. එහෙත් ලංකාවේ තත්ත්වය ඊට වෙනස්ය. මෙරට ඉඩම්වලින් සියයට 80 ක හිමිකාරීත්වය තිබෙන්නේ රජයටය. එබැවින් ආයෝජකයකුට ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් සොයා ගැනීම ද අපහසු වී තිබේ.

සටහන
■ උපුල් වික්‍රමසිංහ